# ශ්‍රී ලාංකේය සිනමා ඉතිහාසය වෙනස් කල ප්‍රේක්ෂක සම්මානයේ හිමිකරු




ලෝක සිනමාවේ සිදුවන්නා වූ යම් තාක්ෂණික වෙනස්වීමක් ශ්‍රී ලාංකේය සිනමා ක්ෂේත්‍රය විසින් අවශෝෂණය කරගැනීම ප්‍රමාදය සිදුවන්නාවූ දෙයක් බව සත්‍යයක් වුවද, එවැනි තාක්ෂණික ක්‍රමවේදයක් අත්පත් කරගැනීම තුළින් ශ්‍රී ලාංකේය සිනමාකරුවන් අන්තර්ජාතික සිනමා සම්මාන උළෙලයන් හීදී දක්වන්නා වූ කුසලතාවය ප්‍රශංසාජනකය. එවන් සිනමා තාක්ෂණික විප්ලවයක් තුළින් නිසි එල ප්‍රයෝජන භුක්ති විඳීමට සමත් වූ නවතම ශ්‍රී ලාංකේය යොවුන් සිනමාකරුවා වන්නේ අමිල සී. කුමාරසිංහ ය.

ඒ ජංගම දුරකථන ආශ්‍රයෙන් රූපගත කල කෙටි සිනමාපට උදෙසා ප්‍රංශයේ පැරිස් නුවර පැවති 11 වෙනි මොබයිල් සිනමා උළෙලේදී, රටවල් 70ක් නියෝජනය කරමින් ඉදිරිපත් වූ කෙටි සිනමාපට 764ක් අභිබවා යමින් උළෙලේ ජන ආකර්ශනීයම සිනමාපටය ලෙස මිලියන 2.4ක සිනමා ප්‍රේක්ෂක ඡන්දයෙන් කිරුළු පැළඳීමයි.එකී සම්මානය 69 වසරක ශ්‍රී ලාංකේය සිනමා ඉතිහාසයේ කුමන හෝ සිනමා ධාරාවකට (දීරඝ වෘත්තාන්ත / වාර්තා / කෙටි) අයත් වූ සිනමා පටයක් ජාත්‍යන්තර සිනමා උළෙලකදී මිලියන ගණනක ජනතා ඡන්දයෙන් කිරුළු පැළඳි ප්‍රථම හා එකම අවස්ථාව ලෙසින් ඉතිහාසයට එක්වේ.



**ඔබ සිනමාවේ 'අ' යනු 'ආ' යනු කියූ ඔබේ පළමු සිනමා නිර්මාණයෙන්ම අපි මේ සංවාදය අරඹමු**

මම මගේ පළමු කෙටි සිනමාපටය නිර්මානය කරන්නේ 2013 වසරේය. ඒ 'මාරයා' නමින්. නමුත් ඒ සිනමාපටය කිසිදු සිනමා උළෙලකට ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව මා විසින් නිර්මාණය කරපු සිනමාපටයක් නොවේ. එය හුදෙක්ම මා තුල බොහෝ කාලයක් පුරාවට පැවති සිනමාපටයක් නිර්මාණය කිරීම නම් සිහිනය සැබෑ කරගැනීමක ප්‍රථඵලයක් පමණයි.

**එසේ නම් ඔබ ජාත්‍යන්තර කිත් පැසසුම් ලද 'පරාමිතික' සිනමාපටය ඔබේ දෙවැනි සිනමා නිර්මාණය?**

ඔව්, එය මගේ දෙවැනි චිත්‍රපටය. නමුත් දේශීය හෝ විදේශීය සිනමා තරගාවලියක් නියෝජනය කල මගේ පළමු සිනමාපටය වන්නේ 'පරාමිතික' යි.

**ජාත්‍යන්තර ඇගයීම් ලැබීමට පෙර 'පරාමිතික' ලංකාවේදී සම්මානයට පාත්‍ර වෙනවා?**

2015 වර්ෂයේ කැළණිය විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කළ ප්‍රතිබිම්බ කලා උලෙලට *(Image Arts Festival – iaf)* ජංගම දුරකථන උපයෝගී කරගනිමින් නිර්මාණය කරන ලද කෙටි සිනමාපට උදෙසා වූ තරග අංගයක් ඇතුළත් වූවා. එහිදී සියලුම සිනමාපට අභිබවමින් උළෙලේ ජයග්‍රාහී සිනමාපටයට හිමි සම්මානය හිමිවන්නේ මගේ සිනමා නිර්මාණයට. ඒ 'පරාමිතික' ලද පළමු සම්මානයයි. දෙවනුව 2015 වසරේ දෙසැම්බර් මාසයේ පැරිස් නුවර පැවති 11 වෙනි මොබයිල් සිනමා උළෙලේදී මිලියන 2.4ක සිනමා ප්‍රේක්ෂක ඡන්දයෙන් උළෙලේ ප්‍රේක්ෂක සම්මානය 'පරාමිතික' සිනමාපටයට හිමි වූවා. ඊට අමතරව බ්‍රසීලයේ පැවති මොබිගුෆියා මොබයිල් සිනමා උළෙලේදී වාර්තා කෙටි සිනමාපට බාණ්ඩයේ තරගකාරී අවසන් වටයට සුදුසුකම් ලද සිනමාපට අතරට එක්වීමට 'පරාමිතික' සිනමාපටයට හැකිවුනා.

**'පරාමිතික' ජංගම දුරකථයකින් නිර්මාණය කල හා විනාඩියක ධාවන කාලයකට සීමා වූ සිනමාපටයක්?**

ඔව්, මෙම සිනමාපටය රූපගත කලේ *"I phone 6 plus"* ජංගම දුරකථනයේ කැමරාව උපයෝගි කරගනිමින්. සිනමාපටය රූපගත කරනවට වඩා මම මුහුන දුන් අසීරුම කාර්යය වුනේ සිනමාපටයේ සංස්කරණයයි. රූ ගත කිරීම් අවසාන වනවිට විනාඩි 45ක් පමණ ධාවන කාලය ක්ලිප්ස් විනාඩියක ධාවන කාලයක් දක්වා අඩු කිරීම උදෙසා සුවිශේෂී වෙහෙසක් දරන්නට සංස්කරණ ශිල්පියා ලෙසින් මා හට සිදුවුනා.



**මෙකී ජයග්‍රහනය පිටුපස ඔබට සවියක් වූ පිරිස බොහෝයි?**

පළමුවෙන්ම සිනමාපටයේ ඇතුළත් වූ එකම චරිතයට පණ පෙවූ හසිත කුලතුංගගේ කැපවීම සිහිපත් කල යුතුමයි. ඊට අමතරව කැමරාකරණයෙන් දුමින්ද්‍ර නතාශ් පීරිස්, ශබ්ද සහ සංගීත සංයෝජනයෙන් පසන් ලියනගේ, සිනමා තිර රචනයෙන් ධනංජය මධුසංක, නිශ්චල ඡායාරූපකරනයෙන් මිලින්ද විජේසේකර, පිටපත් පරිවර්තනයෙන් සහ නැවත ප්‍රති රචනයෙන් පූර්නිමා ගුණසේකර හා දුලිත් පතිරගේ මෙයට එක් වුවා.

**ජාත්‍යන්තර සම්මාන ලැබූ ඔබේ ඊලග පියවර?**

මම සිනමාවට ආගන්තුකයි, නමුත් වසර 9කට ආසන්න කාලයක් මම දෙස් විදෙස වෙළඳ දැන්වීම් සහ රූපවාහිනි වැඩසටහන් ආශ්‍රිතව ග්‍රැෆික්, දෘශ්‍ය ප්‍රයෝග ශා ත්‍රිමාණ සජීවීකරණ ශිලපියෙකු ලෙස කටයුතු කරනවා. ඉතින්,මම එයින් ලබා ගත්ත දැනුම සහ පලපුරුදද් තුළින් මගේ ඊලඟ පියවරට අත තබන්නයි මා මේ දවස්වල වෙහෙසෙන්නේ. මූල්‍යමය ආයෝජන ගැටලු නිසා ලංකාවේ චිත්‍රපටිවල දෘශ්‍ය ප්‍රයෝග ශා ත්‍රිමාණ සජීවීකරණ කටයුතු සිදුවන්නේ ඉතාමත් ප්‍රාථමික මට්ටමින්. නමුත් අපි මේ කඩයිම්, බාදක ජයගත යුතුමයි.

උදිත ලක්මාල් කහඳවආරච්චි